මුසලී ප්‍රාදේශිය සභාව
මන්නාරම දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජනවාරි 24 වන දින ද සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මුසලී ප්‍රාදේශිය සභාවේ මූල්‍යය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දන්නා මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති හා පීඑල්/05/පීඒ/එස්එෆ්පීඑස්ඒඑස් අංක දරණ චක්‍ර ලේඛය පරිදි රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ලැබිය යුතු ගිණුම්
--------------------

නිළධාරීන් 05 කුගෙන් ලැබිය යුතු රු. 83,521 ක් වටිනා ආපදා ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්
---------------------------------------------------

පහත දැක්වෙන නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම් විගනණයේදී නිරීක්ෂණය විය.

| නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් සඳහා යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශිය සභා රීති සංග්‍රහය | |
| I. රීති අංක 5 (XII) | මූල්‍ය හා ගබඩා ගණුදෙණු පිළිබඳ වගකිව යුතු නිළධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| II. | රීති අංක 59 | සෑම වර්ෂයක්ම ආරම්භයේදී ආදායම් පරීක්ෂක හෝ ආදායම් පරිපාලක හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිළධාරියෙකු විසින් සභා බල ප්‍රදේශය තුල කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පැවැත්විය යුතු වුවත් එසේ සිදුකර කර්මාන්ත පිළිබඳ බදු ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| III. | රීති අංක 178(3)(i) | සභා බල ප්‍රදේශය තුල පිහිටි අනුමත ආයතන හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලේඛණයක් පිළියෙල කර නොතිබුණි. |
| IV. | රීති අංක 218 | සභාවේ සභාපති , කාර්මික නිළධාරී සහ සභාවේ ලේකම්වරයා බලය පවරන ලද කවර හෝ නිළධාරියකු ලවා සෑම වර්ෂයකටම වරක් සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පරීක්ෂාවක් සිදුකල යුතු වුවත් මෙම වාර්තාවේ දිනය දක්වා එසේ සිදුකර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා ආඥා පනතේ 150 (1) වගන්තිය | ව්‍යාපාර පිළිබඳ රෙජිස්ටරයක් සකස් කර වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| I. | මුදල් රෙගුලාසි 104 | මුදල් අයකැමි / සරප් භාරයේ තිබූ රු. 12, 920 ක් වටිනා මුදල් අඩුවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| II. | මුදල් රෙගුලාසි 371 | 1998 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලය තුල රු. 419, 703 ක් වටිනා අත්තිකාරම් පියවීමට විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දිනය දක්වා පියවර ගෙන නොතිබුණි. |
| III. | මුදල් රෙගුලාසි 571 | රු.1,350,236 ක් වටිනා පොදු තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි |

| | |
|---|---|
| (ඇ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක 41/90 දරණ හා 1990 ඔක්තොම්බර් 10 දිනැති චක්‍ර ලේඛය | සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 51 ක් සම්බන්ධයෙන් සෑම මාස 06 කට වතාවක් ඉන්ධන දැවීම පිළිබද පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |
| (ඉ) 2002 නොවැම්බර් 28 දිනැති අංක හා IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය | පරිගණක හා එහි උපාංග සම්බන්ධයෙන් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

------------------

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,035, 482 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු. 771 ක් විය. මේ අනුව රු. 5,036,253 කින් මූල්‍ය ප්‍රතිඵලය වර්ධනව වී තිබූ අතර රාජ්‍ය ප්‍රදාන ලැබීම් හා පුනරාවර්තන ආදායම් වැඩි වීම ඊට හේතු වී තිබුණි.

2.2 ආදායම් කළමණාකරණය

------------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය

--------------------------------

සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් අයවැය ගත කළ ආදායම හා රැස්කල සත්‍ය ආදායම අතර රු.6,038,472 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.2 බදු කුලී

---------

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාලය සදහා අයවිය යුතු රු. 231, 344 ක් වූ හිඟ බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 අනෙකුත් ආදායම්

---------------------

සභා බල ප්‍රදේශය තුල දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 10 ක් ස්ථාපිතකර තිබූ අතර ඉන් දුරකථන කුළුණු 04 ක් සදහා වාර්ෂික අළුත් කිරීමේ ගාස්තු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

---------------

රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රැස්කරන ලද රු. 4,430,455 ක් වටිනා අයවිය යුතු මුද්දර ගාස්තු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 කළමනාකරණ දුර්වලතා
------------------------------
පහත දැක්වෙන කරුණු අනාවරණය විය.

(අ) ට්‍රැක්ටර් ට්‍රේලර් 04 ක් වර්ෂ 03 සිට වර්ෂ 05 දක්වා වූ කාල පරාසය තුල භාවිතයට නොගෙන සභා භූමියෙහි නවතා තිබූ අතර ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විකුණා දැමීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පුරනැගුම ව්‍යාපෘතිය මඟින් 2013 වර්ෂයේදී රු. මිලියන 15.1 ක වියදමක් දරා ඉදිකරන ලද ව්‍යාපාරික ස්ථාන 02 ක් සම්පූර්ණ ලෙස භාවිතයට නොගෙන අද දක්වා අතහැර දමා තිබුණි.

3.2 වාහන භාවිතය
-----------------
මෝටර් ග්‍රේඩරය වාර 12 ක් භාවිතය වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේදී සභාව විසින් වැය කරන ලද රු. 154, 850 ක් හා ඩීසල් ලීටර් 16,300 ක් සඳහා දෛනික ධාවන සටහන් සකස් කර නොතිබුණි.

3.3 කාර්යසාධන වාර්තාව
-------------------------
මහා භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5/(4) දරන ලිපියෙහි 1.4.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවක් සකස් කළ යුතු වුවත් සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාවක් 2016 අගෝස්තු 10 දින දක්වා පිළියෙල කර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය
------------------------------------------

4.1 අයවැය පාලනය
--------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රවර්ථන වර්ෂය සඳහා සකස් කළ අයවැය ලේඛණය අනුව වැය විෂයන් 16 ක් සඳහා වෙන්කල ප්‍රතිපාදන වලින් සියයට 40 සිට 100 දක්වා රු. 1,274,301 ක් වටිනා ප්‍රතිපාදන භාවිතා නොකර ඉතිරි කර තිබුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂය සඳහා සකස් කළ අයවැය ලේඛණය අනුව වැය විෂයන් 05 ක් සඳහා වෙන් කළ රු. 364,600 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

4.2 අභ්‍යන්තර විගණනය
------------------------
ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් ඵලදායී ලෙස සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් එකතු කිරීම

(ආ) අයවැය පාලනය

(ඇ) ලැබිය යුතු ගිණුම්

(ඈ) ස්ථාවර තැන්පතු

(ඉ) ගිණුම්කරණය